# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය

Centre for Open and Distance Learn
University of Kelaniya-Sri Lan

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය
(බාහිර) - 2009

සමාජීය විද්‍යා පීඨය

පුස්තකාල හා විඥාපන විද්‍යාව - LISC - E1015

පුස්තකාලයාධිපතිත්වය, තොරතුරු සාක්ෂරතාව හා තොරතුරු කුසලතා

<u>ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න</u>

ප්‍රශ්න සංඛ්‍යාව : 07 යි　　　　කාලය : පැය 03 යි

---

01. "මූලික පරමාර්ථ අනුව සලකා බලන විට අතීත හා නවීන පුස්තකාල අතර විශාල වෙනසක් නැත." ලෝක පුස්තකාල ඉතිහාසයේ වැදගත් සන්ධි ස්ථාන ගෙන හැර පාමින් මේ අදහසට පක්ෂව හෝ විපක්ෂව කරුණු දක්වන්න.
(ලකුණු 20)

02. "පුස්තකාල වෘත්තීය සුවිශේෂ වෘත්තියක් වන්නේ එය අනෙකුත් සියලුම වෘත්තීන්ගේ සංවර්ධනයට මග හෙළි කරන නිසාය." ඉහත සඳහන් ප්‍රකාශය පැහැදිලි කරන්න.
(ලකුණු 20)

03. පුස්තකාල හා සමාජය අතර පවත්නා සබඳතාව නිසා සමාජයට ලැබෙන ප්‍රතිලාභ කවරේ දැයි සැකෙවින් විස්තර කරන්න.
(ලකුණු 20)

04. (i) තොරතුරු සාක්ෂරතාව යනු කුමක්ද? පැහැදිලි කරන්න.
(ලකුණු 05)

(ii) වත්මන් මිනිසාට තොරතුරු සාක්ෂරතා කුසලතා අවශ්‍යවන්නේ මන්ද? විස්තර කරන්න.
(ලකුණු 15)

05. තොරතුරු මූලාශ්‍ර ඇගයීමේ නිර්ණායක කවරේදැයි නිදසුන් සහිතව පැහැදිලි කරන්න.
(ලකුණු 20)

06. "පුස්තකාලයකින් නිසි ප්‍රයෝජන ලබන්නට නම් එය භාවිතා කළ යුතු ආකාරය පිළිබඳ නිසි අවබෝධයක් උපයෝජකයන්ට තිබිය යුතුය" සාර්ථක පුස්තකාල භාවිතයක් සඳහා ඔබ විසින් හිමි කරගත යුතු කුසලතා මොනවාදැයි සැකෙවින් දක්වන්න.
(ලකුණු 20)

07. අධ්‍යාපනික මෙවලමක් වශයෙන් අන්තර්ජාලයේ දායකත්වය ඇගයුමට ලක්කරන්න.
(ලකුණු 20)

*******************************